# පැරණි ශ්‍රී ලංකාව හා චීනය අතර පැවති වාණිජ සම්බන්ධතා පිළිබඳ විමර්ශනයක් (අනුරාධපුර යුගය)

සමන් බන්‍දු හේරත්
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSTRACT

ක්‍රි. පූ. 4 වන සියවස සිට ක්‍රි. ව. 1017 දක්වා වූ කාලය අනුරාධපුර කාලපරිච්ඡේදයට අයත් වේ. මේ කාල වකවානුවේ ලංකාව චීනය සමඟ ගෙන ගියේ කවරාකාරයේ වාණිජ සම්බන්ධතාවයක් ද යන්න පිළිබඳව තොරතුරු සොයා බැලීම මේ විමර්ශනයේ අරමුණ වේ.

ලක්දිව ඉතිහාසය ගොඩනගනු ලබන ප්‍රධාන මූලාශ්‍රය වන දීපවංස හා මහාවංස යන වංසකථාවල පැරණි ලක්දිව පැවති වෙළඳ සම්බන්ධතා පිළිබඳ ප්‍රාමාණික තොරතුරු නොසපයන බැවින් චීන-ලංකා වෙළඳ සම්බන්ධතා පිළිබඳ කරුණු හෙළිකර ගැනීමේදී විදේශීය ලේඛකයන් වන --ෆාහියන්, හියුං සියෑ, මෙගස්තිනිස්, එරටෝස්තිනි, ප්‍රොකෝපියස්, කොස්මස් ඉන්ඩිකොප්ලෙයුස්ටස්, ඇනියස් ප්ලොකේමස්, ඔනෙසික්‍රිටස්, ප්ලිනි, ස්ට්‍රාබෝ මෙන් ම ඔවුන්ගේ කරුණු ඇසුරෙන් ග්‍රන්ථකරණයේ යෙදුණු මැක්ක්‍රිඩෙල් වැන්නවුන්ගේ වාර්තා වැදගත් වේ.

ලංකාව, ලෝකය සමඟ ඇති කරගත් වෙළඳ සම්බන්ධතාවන්හිදී දක්නට ලැබෙන සුවිශේෂත්වය වන්නේ ගෝලීය ආර්ථික සිද්ධාන්ත නොපැවති අතීතයේ, න්‍යායන්වලට යටත් නොවුවත් ඔවුනොවුන් පිළිගත් යම් යම් වෙළඳ ක්‍රමවේදයන් හා තාක්ෂණය පදනම් කරගනිමින් වාණිජ සම්බන්ධතා පැවැතීමයි. ලංකාව සම්බන්ධතා ගොඩනඟාගත් පෙරදිග ලෝකයේ රටවල් අතර චීනය ප්‍රධාන රටක් වේ. ලංකාව චීනය සමඟ සම්බන්ධතා ආරම්භ කළේ ක්‍රි. ව. 1 වන සියවසේදී පමණ ය. මේ කාලයේ සිට ආරම්භ වූ සම්බන්ධතා ක්‍රි. ව. 8 වන සියවස පමණ වන තෙක් අඩු වැඩි වශයෙන් සංවර්ධනය වෙමින් ගමන් කළ ආකාරයක් කරුණු විමර්ශනයේදී දක්නට ලැබේ.

පැරණි ලක්දිව වෙළඳ සම්බන්ධතා බොහෝ දුරට රාජ මැදිහත්වීම හරහා සිදු වී ඇත. රන්, රිදී, මුතු, මැණික්, කපුරු, කරාඹු නැටි, විවිධ වර්ගයේ පාෂාණ විශේෂ ලංකාවෙන් චීනයට යවන ලද අතර චීනයේ සිට ප්‍රධාන වශයෙන් මෙරටට පටපිළි ගෙන්වා ඇත. මහාතිත්ථ හා ගෝකණ්ණ වරාය අනුරාධපුර යුගයේ වෙළඳ සම්බන්ධතාවලදී ප්‍රමුඛත්වය ගත් වරායන් වන අතර පෝචිලි (Po-tchi-li) හා බ්‍රොච් (Bharoch) යන වරාය චීනයේ වැදගත් වරාය විය. ක්‍රි. ව. 428, 430, 435, 515, 523, 527, 670, 711, 750, 762 ආදී ලෙස සියවස් කිහිපයක් ඇතුළත නොයෙක් වසරවල විවිධ රජවරුන් යටතේ චීනය සමඟ ලංකාව තානාපති හා දූත සම්බන්ධතා ගොඩනඟාගෙන තිබේ. වෙළඳ කණ්ඩායම් ලෙස සමහර පිරිස් සම්බන්ධතා ගොඩනගාගෙන ඇති අතර ප්‍රබල ලෙස දක්නට ලැබෙන්නේ රාජ්‍ය මැදිහත් වීමෙන් දූතයන් හා තානාපතියන් මාර්ගයෙන් සිදුවූ වාණිජ සම්බන්ධතා ය. සමහර කාලයන්හිදී කප්පම් වශයෙන් වෙළඳ භාණ්ඩ යවා ඇති අතර එවැනි අවස්ථා චීනයේ ආධිපත්‍යය පිළිගත් අවස්ථා ලෙස සැලකිය හැකිය.